31/05 2022 04:10 PM FAX 0112876169 SECRETARY PSC 0001/0001

**S - 01**

IGP/IN/FAX/ 2576 /2022

225075


දුරකථන / தொலைபேசி / Telephones: 011-2136600, 011-2136650

ලේකම / செயலாளர் / Secretary: 011-2136602

ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2876169, 011-2876181

විද්‍යුත් තැපැල / மின் - அஞ்சல் / E-mail: info@psc.gov.lk

වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.psc.gov.lk


# රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
## அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
## OFFICE OF THE PUBLIC SERVICE COMMISSION


අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල

இல. 1200/9, இராஜமல්வத்தை வீதி, பத்தரமுல்லை

**No. 1200/9, Rajamalwatta Road, Battaramulla**


මගේ අංකය / எனது இல. / My No. PSC/SEC/02/Misc/2022

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date: 2022.05.31

පොලිස්පති කාර්යාලය
31 MAY 2022
කොළඹ 01

ලේකම්

මහජන ආරක්ෂක අමාත්‍යාංශය

<u>ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන් ස්ථානමාරු කිරීම පිළිබඳවයි.</u>

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන් කිහිපදෙනෙකු පොලිස්පතිවරයා විසින් වහාම ක්‍රියාත්මක වන පරිදි ස්ථානමාරු කර ඇති බව පසුගිය දිනවල විවිධ මාධ්‍යයන් ඔස්සේ ප්‍රචාරය වීම පිළිබඳව අද දින රැස් වූ කොමිෂන් සභාව විශේෂ අවධානය යොමු කරන ලදී.

02. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන් හා නියෝජ්‍ය පොලිස්පතිවරුන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ පටිපාටිවලට අනුකූලව ස්ථානමාරු කිරීමේ බලතල 2020 නොවැම්බර් මස 20 දිනැති අංක 2202/24 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් මෙම කොමිෂන් සභාව විසින් ඔබ වෙත පවරා දී ඇත. එසේ වුවද, එවැනි ස්ථානමාරු කිරීමේ පටිපාටි කිසිවක් මේ වන තෙක් මෙම කොමිෂන් සභාවේ අනුමැතියට ඉදිරිපත් කර නොමැති බැවින් එකී නිලධරයින් ස්ථානමාරු කිරීමට පෙර මෙම කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගත යුතු බව රාජ්‍ය සේවා කොමිෂන් සභාව නිරීක්ෂණය කර ඇත.

03. මෙසේ පවරා දී ඇති බලතල ඉක්මවා කටයුතු කිරීම පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් දින තුනක් (03) ඇතුළත කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලෙස මෙම කොමිෂන් සභාව ඔබට නියෝග කර ඇත. ඒ අනුව, අදාළ වාර්තාව කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි 2022.06.03 දිනට පෙර මා වෙත එවන ලෙස රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි කාරුණිකව දන්වා සිටිමි.

එම්.ඒ.බී. දයා සෙනරත්

ලේකම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

පිටපත් :

1. පොලිස්පති - කාරු. දැ.ගැ.ස සහ අ.ක.ස.